*සැ.යු.*: i. මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2026 වර්ෂය සඳහා ගාල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවලට අදාළව ජූරි සභිකයින්ගේ නාම ලේඛනයක් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 2,481 - 2026 මාර්තු මස 20 සිකුරාදා - 2026.03.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු … … | 1160 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | 1173 |


*සැ.යු.*: (i) ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත 2026 මාර්තු මස 13 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පත් කරන ලදී.

(ii) මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2026 මාර්තු මස 13 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) මුදල් ගණුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2026 මාර්තු මස 13 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 අප්‍රේල් මස 10 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 මාර්තු මස 27 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

“යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.”

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2026 ජනවාරි මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1157 - B 82774 - (2026/03)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඩ් වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මඟින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## විගණන සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ විධායක සේවා ගණයේ I පන්තියේ ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති (වරලත් සිවිල් ඉංජිනේරු) තනතුර සඳහා සෘජු ධාරාව මත බඳවා ගැනීම -2025 (2026)

ජාතික විගණන කාර්යාලයේ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ විධායක සේවා ගණයේ I පන්තියේ ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති (වරලත් සිවිල් ඉංජිනේරු) තනතුරට සෘජු ධාරාව මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. බඳවාගැනීමේ ක්‍රමය:-**

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණකර ඇති අයදුම්කරුවන් අතරින්, විගණන සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පරිශිෂ්ටය 03 හි සඳහන් පරිදි පහත නිර්ණායකයන්ට යටත්ව (අංක 5 යටතේ සඳහන්) ලකුණු ලබා දීමේ පටිපාටියට අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 20 |
| තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද | 40 |
| තොරතුරු තාක්ෂණය/පරිගණක හැකියාව පිළිබඳ සුදුසුකම් | 05 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 10 |
| එකතුව | **100** |

*සටහන:-* බඳවා ගැනීමේ මූලික සුදුසුකම් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.
පත්වීම ක්‍රියාත්මක වන දිනය විගණන සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

**02. අවශ්‍ය සුදුසුකම්:-** සෑම අයදුම්කරුවකුම අයදුම්පත් කැඳවන අවසාන දිනට පහත සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

**(i). අධ්‍යාපන සුදුසුකම්** :- අදාළ නොවේ.

**(ii). වෘත්තීය සුදුසුකම් :-**

වරලත් සිවිල් ඉංජිනේරුවරයෙකු වීම.
(මෙම තනතුරු සඳහා සෘජු ධාරාව මත බඳවා ගැනීමේ දී වරලත් සිවිල් ඉංජිනේරුවන් සඳහා එක් තනතුරක් පමණක් වෙන් කරනු ලැබේ.)

**(iii). පළපුරුද්ද:-**

අදාළ වෘත්තිය සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ වසර 12ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

(මේ සම්බන්ධයෙන් සේවා කාලය ගණන් ගැනීමේදී පූර්ණ වැටුප් සහිත, අඩ වැටුප් සහිත සහ වැටුප් රහිත අධ්‍යයන නිවාඩු සැලකිල්ලට ගනු නොලැබේ.)

**(iv). ශාරීරික යෝග්‍යතාව:-**

ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

**(v). වෙනත් සුදුසුකම්:-**

(i). ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
(ii). විශිෂ්ට චරිතයකින් යුක්ත වීම.
(iii). යම් ආගමික පැවිදිවරයක් දරන තැනැත්තකු නොවීම.
(iv). අයදුම්පත් කැඳවනු ලබන නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනට සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

**(vi). වයස:-**

**2026 අප්‍රේල් මස 20** දිනට වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර එදිනට වයස අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. ඒ අනුව 1981.04.20 දින සිට 1991.04.20 දින දක්වා එම දින ද ඇතුළත්ව උපන් දිනය යෙදෙන අයට අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය. (රාජ්‍ය සේවයේ නියුක්ත නිලධරයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**03. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති සහ සේවා කොන්දේසි:-**

(i). මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු

පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ii). මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරයකු මෙම තනතුරට පත් කරනු ලැබුවහොත් වසරක පරිවාස කාලයකට යටත්වේ. එසේ වුවද එම නිලධරයාගේ පූර්ව සේවා කාලය හා පළපුරුද්ද නව තනතුරට අයත් සුදුසුකමක් හා උපවාසයක් නොවන කල්හි අවුරුදු තුනක පරිවාස කාලයට යටත්වේ. තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් ආකාරයට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii). 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන හා ඊට ආනුෂංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව මෙම තනතුරට පත් වී වසර තුනක් ඉකුත්වීමට පෙර සේවයට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

(iv). රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

(v). ඉල්ලුම්කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම් ලත් භාෂා මාධ්‍යය වනුයේ ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

**04. වැටුප් පරිමාණය:-**

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 86,950- 10 x 2,400 - 8 x 2,940 - 17 x 3,900 - රු.200,770/- (පියවර 20) වේ. ඒ අනුව මෙම තනතුරට හිමි වැටුප් කේතය AS 03 - 2025 වන අතර ආරම්භක වැටුප් පියවර රු.138,370/- වේ. (2027.01.01 දින තෙක් ඔබට වැටුප් ගෙවනුයේ එම චක්‍රලේඛයේ උපලේඛන III අනුවය.) මෙයට අමතරව තනතුරට අදාළ වන පරිදි රජය විසින් අනුමතකර ඇති අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ.

**05. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු ලබා දීමේ පටිපාටිය පදනම් කර ගනු ලැබේ.**

| *අනු. අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| **01.** | **අතිරේක අධ්‍යාපන සුදුසුකම් -** | | 25 |
| | **(අ) සාමාන්‍ය උපාධිය** | **10** | |
| | **(ආ) විශේෂ උපාධිය** | **11** | |
| | **(ඇ) 2 පන්තිය සහිත සමාන්‍ය උපාධිය** | **11** | |
| | **(ඈ) 2 පන්තිය සහිත විශේෂ උපාධිය** | **13** | |
| | **(ඉ) 1 පන්තිය සහිත සමාන්‍ය උපාධිය** | **13** | |
| | **(ඊ) 1 පන්තිය සහිත විශේෂ උපාධිය** | **15** | |
| | **(උ) පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (රාජ්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර)** | **18** | |

| අනු. අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| | (ඌ) MA/MSC හෝ ඒ හා සමාන වෙනත් උපාධියක් (රාජ්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර)<br>(එ) ඉහත (ඌ) හි සඳහන් උපාධියකට වඩා ඉහළ උපාධියක් (රාජ්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර) | 20<br>25 | |
| 02. | අතිරේක වෘත්තීය සුදුසුකම් -<br>(මූලික වෘත්තීය සුදුසුකමට අමතරව ලබා ඇති ඉහළම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)<br>(අ) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ / ශ්‍රී ලංකා උසස් කාර්මික අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමාව<br>(ආ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආවසරික II /අන්තර්මාධ්‍ය පරීක්ෂණය / ගිණුම්කරණ හා ව්‍යාපාර සහතික පත්‍රය II /ව්‍යාපාර අදියර/ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ II අදියර පරීක්ෂණය සමත් වීම<br>(ඇ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අවසාන I කොටසේ පරීක්ෂණය / වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ III අදියර පරීක්ෂණය සමත් වීම<br>(ඈ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය<br>(ඉ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ සාමාජිකත්වය | 07<br>09<br>12<br>15<br>20 | 20 |
| 03. | තොරතුරු තාක්ෂණය / පරිගණක හැකියාව පිළිබඳ සුදුසුකම් -<br>විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයකින් පිරිනමනු ලබන මාස 6ක හෝ ඊට වැඩි කාලයක පරිගණක සහතිකපත්‍ර පාඨමාලාවක් සමත්ව තිබීම හා සහතිකයක් ලබා තිබීම. | 05 | 05 |

ඉහත සටහනට අමතරව තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද සඳහා වසරකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 40 ක්ද, සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය සඳහා උපරිම ලකුණු 10 ක් ද වෙන්කර ඇත. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු අනුපිළිවෙල අනුව බඳවා ගැනීම් සිදු කෙරේ.

**06. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :-**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i). පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,

(ii). වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**07. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :-**

(i). අයදුම්පත් "ලේකම්, විගණන සේවා කොමිෂන් සභාව, අංක 35/ඒ, ආචාර්ය එන්.එම්. පෙරේරා මාවත, කොළඹ 08" යන ලිපිනය සඳහන් කර **2026 අප්‍රේල් 20** දින හෝ එදිනට පෙර හෝ ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii). ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වා ඇත. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට අංක 04 දක්වාත් දෙවැනි පිටුව අංක 05 සිට අංක 08 දක්වාත් තෙවැනි පිටුව අංක 09 සිට අංක 10 දක්වාත් වන ආකාරයට පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(iii). අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ " සෘජු ධාරාව මත ජොෂ්ඨ සහකාර විගණකාධිපති (වරලත් සිවිල් ඉංජිනේරු) තනතුරට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(iv). අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිව්රුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු.71,240/- ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

(v). අයදුම්පතක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා තම අයදුම්පත් පමා කරන අයදුම්කරුවන් ඉන් සිදුවිය හැකි ප්‍රතිවිපාක තමන් විසින්ම විඳ දරා ගත යුතු ය.

(vi). විදේශගත ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ට තම අයදුම්පත් විගණකාධිපති වෙත එවනු සඳහා තමන් පදිංචි රටට නැතහොත් ආසන්නම රටට පත්කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී භාරදීමට ස්වකීය අභිමතය පරිදි පිළිවන.

(vii). වෛද්‍ය පරීක්ෂණ සඳහා යානපත්‍ර - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය යටතේ සේවය සඳහා පත් කරනු පිණිස පිටරටින් තෝරාගනු ලබන ශ්‍රී ලාංකික අයදුම්කරුවෙක් වේ නම්, ඔහු සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතු ය. එම පරීක්ෂණය සඳහා වන ගාස්තුවත්, ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ යානපත්‍ර වියදමත් එම අයදුම්කරු විසින්ම දැරිය යුතු ය.

(viii). රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / සංස්ථා සේවයේ නියුක්ත නිලධාරින් විසින් තම අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානියාගේ මාර්ගයෙන් නියමිත දින හෝ එදිනට පෙර ලැබෙන සේ මා වෙත ඉදිරිපත් කළ යුතු අතර, මෙම කාර්යාලයේ කිසිදු නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතු ය.

(ix). මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැති වීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(x). අයදුම්පත්‍රය සමඟ පහත ලේඛනවල සහතික කරන ලද එක් ඡායා පිටපතක් බැගින් අමුණා එවිය යුතු අතර වෙනත් කිසිදු ලේඛනයක් නොඇමිණිය යුතු ය.

a) ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත;

b) උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත;

(සැ.යු :- බෞතිස්ම සහතික හෝ උපකෘත පාසැල් පිළිබඳ රෙගුලාසි සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත්කරන ලද උප්පැන්න සහතික හෝ පිළිගනු නොලැබේ.);

c) සාමාන්‍ය උපාධිය සහ එයට ඉහළ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික පිටපත් (මෙම නිවේදනයේ අංක 5 යටතේ සඳහන්);

d) ප්‍රධාන වෘත්තීය සුදුසුකම් (මෙම නිවේදනයේ 2. II පරිදි) සහ අතිරේක වෘත්තීය සුදුසුකම් (මෙම නිවේදනයේ අංක 5 යටතේ සඳහන්) සනාථ කෙරෙන සහතික පිටපත්;

e) තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වෘත්තිය පළපුරුද්ද පිළිබඳ සහතික;

f) තොරතුරු තාක්ෂණය හා පරිගණක හැකියාව පිළිබඳ සුදුසුකම් (මෙම නිවේදනයේ අංක 5 යටතේ සඳහන්);

g) චරිතය පිළිබඳව සඳහන් වන මෑතකදී ලබාගත් සහතික දෙකක්,
(දැනටමත් රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / සංස්ථා සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට අදාළ නොවේ.)

*සටහන* **-** සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී අදාළ ලේඛනවල මුල් පිටපත්, අයදුම්පත්‍රයට අමුණා ඇති සහතික කරන ලද පිටපත් සනාථකර ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

**8. සාවද්‍ය තොරතුරු සැපයීම:-**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එවැනි අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත් ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

9. පුරප්පාඩු පිරවීමේ හා නොපිරවීමේ අයිතිය විගණන සේවා කොමිෂන් සභාව සතු වේ.

10. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

විගණන සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩී. කේ. විජේසිංහ,
ලේකම්,
විගණන සේවා කොමිෂන් සභාව.

2026 මාර්තු මස 20 දින,
අංක 35/ඒ, ආචාර්ය එන්.එම්.පෙරේරා මාවත,
කොළඹ 08,
විගණන සේවා කොමිෂන් සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

ජාතික විගණන කාර්යාලය

**ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ විධායක සේවා ගණයේ I පන්තියේ ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති (වරලත් සිවිල් ඉංජිනේරු) තනතුර සඳහා සෘජු ධාරාව මත බඳවා ගැනීම - 2025 (2026)**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

(අයදුම් කරන මාධ්‍යය සහ අදාළ අංකය කොටුව තුළ ලියන්න)
සිංහල-2 / දෙමළ- 3/ ඉංග්‍රීසි- 4

**සටහන :** අයදුම් කරනු ලබන මාධ්‍යය පසුව වෙනස් කළ නොහැක.

01. (i) සම්පූර්ණ නම (මයා/මිය/මෙය) : ....................................................................................................
(සිංහලෙන්/ දෙමළෙන්)
(ii) සම්පූර්ණ නම: ....................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(iii) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම: ....................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):
*උදා* : GUNAWARDHANA, M.G.B.S.K.

02. (i) ස්ථිර ලිපිනය : ……………………………………………………………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ii) දුරකථන අංකය: ස්ථාවර : | | | | | | | | | | |

ජංගම : | | | | | | | | | | |

03. (i) ස්ත්‍රී / පුරුෂ භාවය: ……………………………

(ii) විවාහක / අවිවාහක බව: ……………………………

04. (i) උපන් දිනය :

වර්ෂය:…………. මාසය: ………… දිනය:………….

(ii) **2026 අප්‍රේල් 20** දිනට වයස:

අවුරුදු : ………… මාස :……… දින:………

(iii) ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන්ද *නැතහොත්* ලියාපදිංචි කිරීමෙන්ද යන වග?
………………………………………

(iv) ජාතිය: …………………………………..

(v) ජාතික හැඳුනුම්පත් අංකය: | | | | | | | | | | | | |

05.(i) මෙම තනතුර සඳහා අයදුම් කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව ලබාගෙන ඇති අධ්‍යාපන සුදුසුකම්:

| *විභාගය* | *වර්ෂය* | *විෂයයන්* |
|---|---|---|
| | | |
| | | |

(ii) මෙම තනතුර සඳහා අයදුම් කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව ලබාගෙන ඇති වෘත්තීය සුදුසුකම්:

| *සුදුසුකම* | *වර්ෂය* | *ආයතනය* |
|---|---|---|
| | | |
| | | |

(iii) මෙම තනතුරට අයදුම් කිරීම සඳහා ලබාගෙන ඇති ක්ෂේත්‍ර පළපුරුද්ද:

| *තනතුර* | *ආයතනය* | *කාල සීමාව* |
|---|---|---|
| | | |
| | | |

(iv) භාෂා ප්‍රවීණතාවය :

සිංහල : ☐ දෙමළ : ☐ ඉංග්‍රීසි: ☐

06. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :

(i). තනතුර : ………………………………………………………………………………………………

(ii). දෙපාර්තමේන්තුව/ ආයතනය: ………………………………………………………………………

(iii). පත් වූ දිනය : ………………………………………………………………………………………

(iv). ස්ථිරද, විශ්‍රාම වැටුප් සහිතද, තාවකාලිකද, *නැතහොත්* කොන්ත්‍රාත් පදනම මතද යන වග: ……………....................

..............................................................……………………………………………………………………

(v). වාර්ෂික වැටුප් පරිමාණය: ………………………………………………………………………………

(vi). දැනට ලබන වාර්ෂික වැටුප:……………………………………..…………………………………………

07. ඔබ ගැන තොරතුරු විමසා දැනගත හැකි පුද්ගලයන් දෙදෙනෙකුගේ නම, ලිපිනය, තනතුර/රැකියාව සහ දුරකථන අංකය සඳහන් කරන්න.

(i). ……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

(ii). ……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

08. අයදුම්කරුගේ සහතිකය:

මෙම අයදුම්පත්‍රයෙහි ම විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත්, මම දැන සිටිමි.

.................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ………………

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ………………………මහතා / මහත්මිය / මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, 2026 ........... මස ............ වැනි දින ඔහු / ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් ප්‍රකාශ කරමි.

..…………………………………..,
අත්සන සහතික කරන අයගේ අත්සන.

දිනය : ………………………
ස්ථානය : ……………………………….
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

10. අයදුම්කරු රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නිරත නම්,ඔහු පිළිබඳව ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ………………………………………………….. නමැති අයදුම්කරු / අයදුම්කාරිය ……………………වැනි දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත්, ඔහුගේ / ඇයගේ සේවය සතුටුදායක බවත්, අයදුම්කරු / අයදුම්කාරිය සේවයේ ස්ථිර කර ඇති /නැති බවත්, ඉහත 05 හි සඳහන් කර ඇති තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, ................ දින ඔහු / ඇය මා ඉදිරිපිටදී අත්සන් කළ බවත්, මෙයින් සහතික කරමි.

.....................................................,
රාජ්‍ය/ පළාත් රාජ්‍ය ආයතන ප්‍රධානියාගේ හෝ
ඔහුගේ බලයලත් නිලධාරියාගේ අත්සන.

දිනය:.............................

03 - 623

**අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය**

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

**ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ විද්‍යාත්මක පර්යේෂණ නිලධාරි තනතුරට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම - 2026**

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ විද්‍යාත්මක පර්යේෂණ නිලධාරි තනතුරු පුරප්පාඩු 50 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

**අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2026/04/06 වේ.**

මෙම තනතුර කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා තනතුරක් වන අතර, ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර පත්වීම් සහිත නිලධාරින්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි. මෙම තනතුර සඳහා බඳවා ගනු ලබන්නේ එක් වර්ෂයක කාලයක් සඳහා පමණි.

01. විද්‍යාත්මක පර්යේෂණ නිලධාරි (කොන්ත්‍රාත්) රාජකාරි විස්තර :

නඩු භාණ්ඩ විශ්ලේෂණ කටයුතු කඩිනම් කිරීම සඳහා විද්‍යාගාර පරීක්ෂණ කටයුතු සහ පරීක්ෂණ වාර්තා පිළියෙල කිරීමට ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සහය වීමේ කාර්යයන්.

02. දීමනා :

මාසික දීමනාව - රු. 74,438/- හා ජීවන වියදම් දීමනාව රු.17,800/- ක් වේ.

03. වයස් සීමාව : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා 40 ට නොවැඩි විය යුතුය.

04. (I) අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන රසායන විද්‍යාව ප්‍රධාන විෂයයක් සහිත විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම;

*හෝ*

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන රසායන විද්‍යාව ප්‍රධාන විෂයයක් සහිත විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම;

*හෝ*

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් ආයතනයකින් රසායන විද්‍යාව ප්‍රධාන විෂයයක් සහිත විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

(II). කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම තනතුරෙහි රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

05. වෙනත්:

i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.
ii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
iii. තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

06. බඳවා ගැනීමේ ක්‍රමය : යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයක් මගින් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින්

i. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී මූලික සුදුසුකම් පරීක්ෂා කරන අතර, ලකුණු ලබාදෙනු නොලැබේ.
ii. යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| අනු. අංක | ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | ලබාගත යුතු ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්**<br><br>(I) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ වන ආයතනයකින් - රසායන විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු විශේෂ උපාධියක් ලබා තිබීම.<br><br>• පළමු පෙළ සාමාර්ථයක් සහිතව 10<br>• දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිතව 8<br>• දෙවන පෙළ පහළ සාමාර්ථයක් සහිතව 5<br><br>(II) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ වන ආයතනයකින් - රසායන විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරන ලද විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.<br><br>• පළමු පෙළ සාමාර්ථයක් සහිතව 8<br>• දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිතව 5<br>• දෙවන පෙළ පහළ සාමාර්ථය 3<br><br>ඉහත I හා II සුදුසුකම් වලින් එකක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>(ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 10 කි)<br><br>(III) ක්ෂේත්‍රයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ වන ආයතනයකින් ලබාගත් - රසායන විද්‍යාව පිළිබඳ<br>• පශ්චාත් උපාධියක් සඳහා ලකුණු 15<br>• පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා ලකුණු 10<br><br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ. උපරිම ලකුණු 15) | **25** | |

| අනු. අංක | ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | ලබාගත යුතු ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 02. | **ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්ද**<br><br>I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයක හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයක හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ වන ආයතනයක ශිල්ප ප්‍රදර්ශක (Demonstrator) ලෙස පළපුරුද්ද.<br><br>• වසරකට 10<br>• මාස 06 ට වැඩි 08<br>• මාස 03ට වැඩි 05<br>• මාස 03ට අඩු - ලකුණු ලබා නොදේ.<br><br>(I ට අදාළව ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු 30 ක් වේ)<br><br>II. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ සීමාවාසික පුහුණුව සම්පූර්ණ කිරීම.<br>• වසරකට 20<br>• මාස 06 කට වැඩි 15<br>• මාස 03 කට වැඩි 12<br>• මාස 03 ට අඩු 06<br><br>(II ට අදාළව ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු 20 ක් වේ)<br><br>III. රජයේ හෝ පෞද්ගලික ආයතනවල රසායනාගාර විද්‍යාගාරවල පර්යේෂණ නිලධාරි, රසායනාගාර සහකාර ලෙස<br>• වසරකට ලකුණු 10<br>• මාස 06කට වැඩි ලකුණු 08<br>• මාස 03 ට වැඩි ලකුණු 05<br>• මාස 03ට අඩු ලකුණු ලබා නොදේ<br><br>(III ට අදාළව ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු 10 ක් වේ)<br><br>ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්ද සඳහා ලකුණු ලබා දීමේදී සේවා කාලය සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.<br><br>සේවා කාලය සනාථ කිරීම සඳහා විධිමත් සේවා සහතික ඉදිරිපත් කළ යුතුය. | **60** | |
| 03. | පර්යේෂණ නිබන්ධන<br><br>I. දේශීය විදේශීය වශයෙන් ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ කටයුතුවල නිරත වී පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර තිබීම.<br><br>( එක් නිබන්ධනයකට ලකුණු 05 බැගින් පර්යේෂණ නිබන්ධන/ වාර්තා 02 ක් සඳහා පමණක් ලකුණු ලබා දේ. උපාධිය හෝ පශ්චාත් උපාධියට අදාළව සිදු කළ පර්යේෂණ නිබන්ධන සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ) | 10 | |

| *අනු. අංක* | *ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *ලබාගත යුතු ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 04. | **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය**<br>i. සන්නිවේදන හැකියාව<br>ii. පෞරුෂත්වය | **05** | |
| | එකතුව | **100** | |

iii. ඉහත සඳහන් සුදුසුකම් සනාථ කර ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත එම සහතික වල මුල් පිටපත ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

iv. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත ඉහළම ලකුණු ලබාගත් සහ මූලික සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කළ අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

07. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

i. විද්‍යාත්මක පර්යේෂණ නිලධාරි (කොන්ත්‍රාත්) තනතුරේ සේවය කරමින් සිටින කිසියම් අවස්ථාවකදී හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ වෙනත් කිසියම් අවස්ථාවකදී හෝ අපේක්ෂකයා විසින් /ඔහු වෙනුවෙන් ලබා දී ඇති/ සපයා ඇති තොරතුරු නිවැරදි සහ බල සහිත ඒවා නොවේ යැයි හෙළි වුවහොත් කිසිදු පූර්ව දැනුම්දීමකින් හා වන්දි ගෙවීමකින් තොරව වහාම ක්‍රියාත්මක වන පරිදි සේවය ලබා ගැනීම අවසන් කරනු ලැබේ.

ii. විද්‍යාත්මක පර්යේෂණ නිලධාරි (කොන්ත්‍රාත්) ලෙස තෝරා ගන්නා අයෙකුට එම තෝරා ගැනීම මත ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් කිසිදු රජයේ ආයතනයක කිසිදු ස්ථිර තනතුරක් ලබා ගැනීමට විශේෂ හිමිකමක් නොමැත.

08. සේවා කොන්දේසි :

i. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2023/29 හා 2022/12/14 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන හා චක්‍රලේඛ අදාළ වේ.

ii. ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා විසින් කලින් කලට පනවනු ලබන විධිවිධාන හා රෙගුලාසිවලටද යටත් වීමට එකඟ විය යුතු ය.

09. අයදුම්පත් ඉදිරිපත් කිරීම:

ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනයේ අවසානයේ දැක්වේ. අයදුම්පත A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කළ යුතු අතර, අයදුම්පත බහා එවනු ලබන ලිපිකවරයේ වම්පස උඩ කෙලවරේ **"විද්‍යාත්මක පර්යේෂණ නිලධාරි (කොන්ත්‍රාත්)"** යනුවෙන් සඳහන් කර "ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, අංක 31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල" ලිපිනයට 2026/04/06 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. අයදුම්පත සහතික කිරීම:

අයදුම්පත්‍රයේ ඇති අයදුම්කරුගේ අත්සන රජයේ විදුහල්පතිවරයකු හෝ සාමදාන විනිශ්චයකරුවෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු /නීතිඥවරයෙකු /ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධරයකු විසින් හෝ සහතික කරනු ලැබිය යුතු ය.

11. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම පිළිබඳව කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

12. පුරප්පාඩු පිරවීමේ, නොපිරවීමේ හෝ කොටසක් පිරවීම පිළිබඳ අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

13. මෙම නිවේදනයේ සිංහල,දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් ඇත්තේ නම් එවැනි විටකදී සිංහල භාෂා පාඨයේ සඳහන් විධිවිධාන බලපැවැත්විය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන,**
ලේකම්,
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය.

2026 මාර්තු 13 දින,
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය,
අංක 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

***ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව***

කොන්ත්‍රාත් පදනම මත විද්‍යාත්මක පර්යේෂණ නිලධාරි තනතුරට ඉල්ලුම් කිරීම සඳහා වූ අයදුම්පත

01.

i. සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :------------------

ii. සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) :-----------------------

iii. මුලකුරු සමඟ නම (සිංහලෙන්/දෙමළෙන්) : -------------------

iv. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) :-----------------------

02. ස්ථිර ලිපිනය :

i. සිංහලෙන්/දෙමළෙන් : -----------------------

ii. ඉංග්‍රීසියෙන් : -------------------

iii. දුරකථන අංකය (නිවස) :--------------- (ජංගම) :-------------------

03. උපන්දිනය : | | | | | | | | |

2026/04/06 දිනට (අයදුම්පත් කැඳවන අවසන් දිනට) වයස :

අවුරුදු : | | | මාස : | | | දින : | | |

04. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

05. දිස්ත්‍රික්කය : (සිංහලෙන්/දෙමළෙන්) [ ] ඉංග්‍රීසියෙන් : [ ]

06. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :
(සිංහලෙන්/දෙමළෙන්) [ ]
(ඉංග්‍රීසියෙන්) [ ]

ග්‍රාම නිලධාරි කොට්ඨාශය :
(සිංහලෙන්/දෙමළෙන්) [ ]
(ඉංග්‍රීසියෙන්) [ ]

07. අධ්‍යාපන සුදුසුකම්:

i. ලබාගත් උපාධිය :

| *වලංගු දිනය* | *ක්ෂේත්‍රය* | *ආයතනය/ විශ්වවිද්‍යාලය* |
|---|---|---|
| | | |
| | | |
| | | |

08. අතිරේක අධ්‍යාපන සුදුසුකම්:

| *වලංගු දිනය* | *ක්ෂේත්‍රය* | *ආයතනය/ විශ්වවිද්‍යාලය* |
|---|---|---|
| | | |
| | | |

09. ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්ද:

10. පර්යේෂණ නිබන්ධන/ පර්යේෂණ වාර්තා ඉදිරිපත් කිරීම:

11. ඔබ කිසියම් චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබෙනම් ඒ පිළිබඳ විස්තර දක්වන්න. :

12. අයදුම්කරුගේ සහතිකය:

(අ) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.
(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය හා වැරදි සහගත බව මා පත් කරනු ලැබීමට පෙර සොයාගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු වන බවටත් පත්වීම් ලැබීමෙන් පසුව අනාවරණය වුවහොත් මගේ සේවය අවසන් කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

..........................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ..........................

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන, ජාතික හැඳුනුම්පත් අංක ....................... දරන ............................මහතා/මහත්මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා බවත් ඔහු/ඇය අද දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

...............................,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ නම:...................
තනතුර:........................
ලිපිනය:.......................

03 - 633

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

වෙබ් ලේඛක MN 2-2025 (කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - බහුකාර්ය බණ්ඩ 1 සේවා ගණය සඳහා) බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින ඉහත සඳහන් තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත්, අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් ද සමග **2026 අප්‍රේල් මස 20 දින** හෝ ඊට පෙර ලැබෙන සේ, **රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, කිරුළපන මාවත, කොළඹ 05** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. තමන් අයදුම්කරන තනතුර කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය. (මෙම දැන්වීම www.governmentinformation.lk වෙබ් අඩවිය ඔස්සේද ලබා ගත හැකිය.)

**වෙබ් ලේඛක තනතුර - පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 06 (සිංහල මාධ්‍ය 1, දෙමළ මාධ්‍ය 2, ඉංග්‍රීසි මාධ්‍ය 03)**

1. **වැටුප් පරිමාණය** - 2025.03.25 දිනැති අංක 10/2025 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 02-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමිවන අතර එයට අදාළ වැටුප් පරිමාණය

   **රු.48,470-10×540-11×630-10×1,010-10×1,190-රු.82,800/-**

   ක් වන අතර එම වැටුප ඔබට හිමිවන්නේ 2027.01.01 දින සිට වේ . එම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි ඔබගේ පත්වීම් දින සිට වැටුප් ගෙවනු ලැබේ.

2. **වයස් සීමාව -** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

3. **අධ්‍යාපන සුදුසුකම් -** සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක වරක දී විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම;

   *සහ*

   අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබීම.

4. **වෘත්තීය සුදුසුකම් -** තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් අනුමත ආයතන විසින් පිරිනමනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම හෝ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ඊට ඉහළ සුදුසුකමක් ලබා තිබීම.

5. **පළපුරුද්ද - අදාළ නොවේ.**

6. **කායික සුදුසුකම්** - සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

7. **බඳවා ගැනීමේ ක්‍රමය** - ලිඛිත විභාගය හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගිනි. (සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.)

8. **විභාග පරිපාටිය -** රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද ආයතනයක් මගින් විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන් ම පිළිතුරු සැපයිය යුතු ය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| සමාජ මාධ්‍ය හා පුවත්පත් කලාව | පැය 01 | 100 | 40 |
| භාෂා හැකියාව හා පුවත්පත් කලාව | පැය 02 $^{1}/_{2}$ | 100 | 40 |

**විභාගය සඳහා වන විෂය නිර්දේශය**

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| සමාජ මාධ්‍ය හා පුවත්පත් කලාව | ප්‍රවෘත්ති රචනය<br>ඍජු මාර්ගගත ප්‍රවෘත්ති රචනය<br>වෙබ් අඩවි තුළ ප්‍රවෘත්ති පළ කිරීම<br>සමාජ මාධ්‍ය හා සන්නිවේදන තාක්ෂණික උපක්‍රම<br>පුවත්පත් සාකච්ඡා හා ප්‍රවෘත්ති ගොනු කිරීම<br>ඡායාරූප හා වෙබ් අඩවි සන්නිවේදනය |
| භාෂා හැකියාව හා පුවත්පත් කලාව | පුවත්පත් භාෂාව<br>ප්‍රවෘත්තිකරණය<br>භාෂාව හා සිරස්තල<br>භාෂාව හා ඡායාරූප<br>විශේෂාංගකරණ හා වාර්තා භාෂාව<br>නිර්මාණාත්මක භාෂාව |

**9. සේවා නියමයන් හා කොන්දේසි -**

**I.** මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. ඔබ වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

**II.** මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ. තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුලත බඳවාගැනීම් පටිපාටියේ සඳහන් ආකාරයට පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

**III.** 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සහ ඊට අනුෂාංගික සඳහන් විධි විධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු වේ.

**IV.** අංක 2310/29 දරන 2022.12.14 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් පළ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුවේ අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

**V.** ඉල්ලුම්කරනු ලබන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ නොදෙන අතර ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍ය වනුයේ ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

**10. තනතුරට අදාළ කාර්යයන් -**

I. පාර්ලිමේන්තුව/ අමාත්‍යාංශ/රජයේ ආයතන/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල මාධ්‍ය ආවරණවලට සහභාගී වීම හා දෛනික ප්‍රවෘත්ති සකස්කර ඉදිරිපත් කිරීම.

II. රජයේ පුවත් රජයේ නිල වෙබ් අඩවියට (සිංහල/ දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයෙන්) ඇතුළත් කිරීම.

III. අධ්‍යක්ෂ (විශේෂ මාධ්‍ය ඒකකය) සහ වෙබ් සංස්කාරක විසින් පවරන ලද රාජකාරි ඉටු කිරීම.

IV. රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අනෙකුත් මාණ්ඩලික නිලධාරීන් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි ඉටු කිරීම.

**11.** අයදුම්කරුවන් විසින් සහතිකවල සහතික කළ පිටපත් (මුල් පිටපත නොවේ) සිය අයදුම්පත්වලට අමුණා එවිය යුතු අතර ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

I. උප්පැන්න සහතිකය;

II. අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන ලිපි;

III. වෘත්තීමය සුදුසුකම් සනාථ කෙරෙන ලිපි.

**12.** රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතු ය.

**13.** අයදුම්පත්‍රයෙහි සඳහන්වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

**14.** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන (දැනට රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන්නේ නම්) හෝ, ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**15. අත්සන සහතික කිරීම -** දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවෙකුගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු විසිනි. අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන්, ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතු ය. එනම් සාමදාන විනිශ්වයකාරවරයෙකු, නීතිඥයකු, නොතාරිස් කෙනෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයකු, වාර්ෂිකව රු.782,808/-ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු, බෞද්ධ විහාරයක විහාරාධිපති නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන කෙනෙකු විය යුතු ය.

**16. විභාග කොන්දේසි -**

I. විභාග ගාස්තුව රු.1000/- කි. විභාග ගාස්තු ගෙවීමේ **දී රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ නමින් මහජන බැංකුවේ නාරාහේන්පිට ශාඛාවේ 119100109026220 ගිණුම් අංකය** වෙත බැර කර, එහි රිසිට්පත අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ අමුණා එවිය යුතු ය.

II. රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ආයතනයක් මගින් ලිඛිත විභාගය **2026 මැයි මාසයේ දී කොළඹ දී** පවත්වනු ලැබේ.

III. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වෙත රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද ආයතනය මගින් විභාග ප්‍රවේශ පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් යොමු කරනු ලැබේ.

IV. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය.

**17.** සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවැනි අවස්ථාවක සිංහල නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**එච්. එස්. කේ. ජේ. බණ්ඩාර,**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

2026 මාර්තු මස 10 දින,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
අංක 163, කිරුළපන මාවත,
කොළඹ 05.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

**වෙබ් ලේඛක තනතුර**

ඉල්ලුම් කරන මාධ්‍යය

| | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |
| ඉංග්‍රීසි | |

01 (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) : ..........................................................................................................................
..........................................................................................................................

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහලෙන්) : ..........................................................................................................................
..........................................................................................................................

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : (Mr. / Mrs./ Miss)
..........................................................................................................................
..........................................................................................................................

02 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

03 (අ) පෞද්ගලික ලිපිනය : ..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................

දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

(ආ) කාර්යාලයීය ලිපිනය (දැනට රැකියාවක නියුතුවන්නේ නම්) :
..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................

දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කළ යුතු ලිපිනය :

**පෞද්ගලික** ☐ **කාර්යාලයීය** ☐

04. (අ) උපන් දිනය : අවුරුද්ද .......................... මාසය : ........................ දිනය : .......................
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතු ය.)

(ආ) අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස : අවු. .......................... මාස : ........................ දින : .......................

05 විවාහක/ අවිවාහක බව : විවාහක/ අවිවාහක

06 ස්ත්‍රී / පුරුෂභාවය : ස්ත්‍රී / පුරුෂ

07 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු ද යන බව : ඔව්/ නැත

08 අධ්‍යාපන සුදුසුකම් : (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.)

අ.පො.ස. (උ/පෙළ) විභාගය : වර්ෂය .......................... විභාග අංකය : ........................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

අ.පො.ස. (සා/පෙළ) විභාගය : වර්ෂය .......................... විභාග අංකය : ........................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

09 වෘත්තීය සුදුසුකම් : (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.)

| *පාඨමාලාව* | *ආයතනය* | *වලංගු දිනය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

10 වෙනත් සුදුසුකම් : (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.)

| ආයතනය | සුදුසුකම් | වලංගු කාලය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

11. වත්මන් රැකියාව පිළිබඳ විස්තර (රැකියාවක නියුතුවන අයවළුන් සඳහා පමණි) :
   (අ) ආයතනයේ නම හා ලිපිනය : ..............................................................................................................
   ..............................................................................................................
   (ආ) මුල් පත්වීමේ දිනය : ..............................................................................................................
   (ඇ) දැනට දරන තනතුර : ..............................................................................................................
   (ඈ) මාසික මූලික වැටුප : ..............................................................................................................
   (ඉ) දීමනා : ..............................................................................................................
   (ඊ) දළ වැටුප : ..............................................................................................................

12. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද? ඔව්/ නැත
   ඔව් නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න. ..............................................................................................................

13. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද? ඔව්/ නැත
   ඔව් නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න. ..............................................................................................................

14. විභාග ගාස්තු ගෙවන ලද බැංකුව : ........................................ ශාඛාව : ....................................................

| විභාග ගාස්තු ගෙවන ලද ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

**අයදුම්කරුගේ සහතිකය :**

මවිසින් මෙම අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළිවුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමටත් හේතුවන බව දනිමි.

.................................. ........................................................,
දිනය අයදුම්කරුගේ අත්සන.

---

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .............................................................................................. මයා/ මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ............................. දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බව ද, සහතික කරමි.

.....................................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

සම්පූර්ණ නම :.......................................
තනතුර :.......................................
දිනය :.......................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

**(රාජ්‍ය ආයතනවල/ පළාත් රාජ්‍ය සේවයේ/ ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)**

**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්,**

මෙම ආයතනයේ ................................................................................. තනතුර දරන, ............................................. මයා/ මිය/ මෙනවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු/ ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති/ නොමැති බවත්, ඔහුගේ / ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහි ව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/ නොහැක. (කරුණාකර අනවශ්‍ය වචන කපා හරින්න.)

දිනය : ....................................

............................................................,
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

03 - 406

---

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

-

තාක්ෂණ නිලධාරි (III) ශ්‍රේණිය (අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණය) තනතුරට විවෘත පදනමින් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින ඉහත සඳහන් තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්වයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත්, අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත්ද සමඟ **2026 අප්‍රේල් මස 20 දින** හෝ ඊට පෙර ලැබෙන සේ, **රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්,රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, කිරුළපන මාවත, කොළඹ 05** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තමන් අයදුම්කරන තනතුර කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය. (මෙම දැන්වීම www.governmentinformation.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබා ගත හැකිය.)

**තාක්ෂණ නිලධාරි (III) තනතුර - පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 02**

**1. වැටුප් පරිමාණය :-** 2025.03.25 දිනැති අංක 10/2025 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 03-2025 වැටුප් කේතය යටතේ වන

**රු.52,250-10×800-11×1,190-10×1,320-10×1,350-රු.100,040/-**

ක් මෙම තනතුරට හිමිවන අතර, එම වැටුප ඔබට හිමිවන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මක වන දින සිට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

**2. වයස් සීමාව :-** අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

**3. අධ්‍යාපන සුදුසුකම් :-**

**(i)** සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

**(ii)** භෞතික විද්‍යාව/රසායන විද්‍යාව ඇතුළත්ව විද්‍යා විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත් වීම .

**4. වෘත්තීය සුදුසුකම් :-**

මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව;

*හෝ*

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;

*හෝ*

රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ)6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම, (මෙහිදී රැකියා ක්ෂේත්‍රය යන්න රජයේ චිත්‍රපට අංශයේ වීඩියෝ කැමරාකරණය, සංස්කරණය, ශබ්ද කාර්මික තාක්ෂණය, රසායනාගාර කටයුතු, මෝටර් වාහන නඩත්තුව හා විදුලි උපකරණ හා ගොඩනැගිලි නඩත්තුව ඇතුළත් වේ.);

*හෝ*

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

5. **පළපුරුද්ද :-** අවශ්‍ය නොවේ.

6. **කායික සුදුසුකම් :-**

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

7. **වෙනත් සුදුසුකම් :-**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
II. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය ඉහත දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුයි.

8. **බඳවා ගැනීමේ ක්‍රමය :-** ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

9. **විභාග පරිපාටිය :-** මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතු ය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | පැය 01 | 100 | 40 |

**විභාගය සඳහා වන විෂය නිර්දේශය**

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලත්වයත්, සිතීමේ විශ්ලේෂණ තත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා සැකසූ බහුවරණ ප්‍රශ්නවලින් යුතු ප්‍රශ්න පත්‍රයකි. |
| පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | තනතුරුවලට අදාළව බහුවරණ ස්වරූපයෙන් යුක්ත ප්‍රශ්න හා තෝරාගෙන පිළිතුරු සැපයිය හැකි ව්‍යුහගත ස්වභාවයේ ප්‍රශ්නවලින් සමන්විතය. |

10. **සේවා නියමයන් හා කොන්දේසි :-**

**I.** මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. ඔබ වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

**II.** මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ. තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවාගැනීම් පටිපාටියේ සඳහන් ආකාරයට පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

**III.** 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සහ ඊට අනුෂාංගික සඳහන් විධි විධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කළ යුතු වේ.

**IV.** 2022.12.14 දිනැති හා අංක 2310/29 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් පළ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසි වලට ද, දෙපාර්තමේන්තුවේ අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

**V.** ඉල්ලුම්කරනු ලබන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ නොදෙන අතර ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍ය වනුයේ ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

**11.** **තනතුරට අදාළ කාර්යයන් :-** දෙපාර්තමේන්තුවේ තාක්ෂණික හා කාර්මික කාර්යයන් ඉටු කිරීම.

**12.** අයදුම්කරුවන් විසින් සහතිකවල සහතික කළ පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට අමුණා එවිය යුතු අතර ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

I. උප්පැන්න සහතිකය,
II. අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන ලිපි,
III. වෘත්තීමය සුදුසුකම් සනාථ කෙරෙන ලිපි.

**13.** රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

**14.** අයදුම්පත්‍රයෙහි සඳහන්වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සෙකු බවට නම් කරනු ලැබීමටත්, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

**15.** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන (දැනට රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන්නේ නම්) හෝ, ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**16.** **අත්සන සහතික කිරීම -** දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවෙකුගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු විසිනි. අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන්, ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතුය. එනම් සාමදාන විනිශ්චයකාරවරයෙකු, නීතිඥයකු, නොතාරිස් කෙනෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයකු, වාර්ෂිකව රු.782,808/- ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු, බෞද්ධ විහාරයක විහාරාධිපති නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍යාය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන කෙනෙකු විය යුතු ය.

**17.** **විභාග කොන්දේසි :**

I. විභාග ගාස්තුව රු.1,000/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී **රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයා නමින් මහජන බැංකුවේ නාරාහේන්පිට ශාඛාවේ 119100109026220 ගිණුම් අංකය** වෙත බැරකර, එහි රිසිට්පත අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ අලවා එවිය යුතු ය.

II. රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ආයතනයක් මඟින් **ලිඛිත විභාගය 2026 මැයි මස කොළඹ දී** පවත්වනු ලැබේ.

III. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වෙත රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද ආයතනය මඟින් විභාග ප්‍රවේශ පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් යොමු කරනු ලැබේ.

IV. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය.

**18.** සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවැනි අවස්ථාවක සිංහල නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**එච්. එස්. කේ. ජේ. බණ්ඩාර,**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

2026 මාර්තු මස 10 දින,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
අංක 163, කිරුළපන මාවත,
කොළඹ 05.

| මාධ්‍යය | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |
| ඉංග්‍රීසි | |

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

තාක්ෂණික නිලධාරි (III) ශ්‍රේණිය - විවෘත පදනම

**ආදර්ශ අයදුම්පත්‍රය**

01 (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) : ..............................................................................................................................
.........................................................................................................................................................

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහලෙන්) : ..............................................................................................................
.........................................................................................................................................................

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : (Mr. / Mrs./ Miss.)
.........................................................................................................................................................
.........................................................................................................................................................

2.0 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

3.0 (අ) පෞද්ගලික ලිපිනය : ......................................................................................................................................
.........................................................................................................................................................
.........................................................................................................................................................

දුරකථන අංකය : | | | | | | | | | | |

(ආ) කාර්යාලයීය ලිපිනය (දැනට රැකියාවක නියුතුවන්නේ නම් :
.........................................................................................................................................................
.........................................................................................................................................................
.........................................................................................................................................................

දුරකථන අංකය : | | | | | | | | | | |

(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කළ යුතු ලිපිනය :

**පෞද්ගලික** ☐ **කාර්යාලයීය** ☐

04. (අ) උපන් දිනය : අවුරුද්ද : .......................... මාසය : ........................ දිනය : .......................

(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතු ය.)

(ආ) අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස : අවු. .......................... මාස : ........................ දින : .......................

5.0 විවාහක/ අවිවාහක බව : විවාහක/ අවිවාහක

6.0 ස්ත්‍රී / පුරුෂභාවය : ස්ත්‍රී / පුරුෂ

7.0 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු ද යන බව : ඔව්/ නැත

88 අධ්‍යාපන සුදුසුකම් : (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.)

*අ.පො.ස. (උ/පෙළ) විභාගය : වර්ෂය ..........................* *විභාග අංකය : ........................*

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

*අ.පො.ස. (සා/පෙළ) විභාගය : වර්ෂය ..........................* *විභාග අංකය : ........................*

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

09 වෘත්තීය සුදුසුකම් : (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.)

| *පාඨමාලාව* | *ආයතනය* | *වලංගු දිනය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

10 වෙනත් සුදුසුකම් : (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.)

| *ආයතනය* | *සුදුසුකම්* | *අදාළ කාල සීමාව/ වලංගු දිනය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

11. වත්මන් රැකියාව පිළිබඳ විස්තර : (දැනට රැකියාවක නියුතුවන්නන් විසින් පමණක් සම්පූර්ණ කරන්න)

(අ) ආයතනයේ නම හා ලිපිනය : ..........................................................................................................
..........................................................................................................................................

(ආ) මුල් පත්වීමේ දිනය : ..........................................................................................................

(ඇ) දැනට දරන තනතුර : ..........................................................................................................

12. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද? ඔව්/ නැත
ඔව් නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න. ..........................................................................................................................

13. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද? ඔව්/ නැත
ඔව් නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න. ..........................................................................................................................

14. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

I. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය : ........................................................................
II. ලදුපත් අංකය හා දිනය : ..........................................................................
III. ගෙවූ මුදල : ....................................................................

| |
|---|
| *විභාග ගාස්තු ගෙවන ලද ලදුපත නොගැළවෙන සේ මෙහි අලවන්න.* |

**අයදුම්කරුගේ සහතිකය :**

මවිසින් මෙම අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළිවුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමටත් හේතුවන බව දනිමි.

.................................. ........................................................,
දිනය අයදුම්කරුගේ අත්සන.

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .................................................................................... මයා/ මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ............................. දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බව ද, සහතික කරමි.

දිනය ................................ ........................................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

සම්පූර්ණ නම :.......................................
තනතුර :.......................................
දිනය :.......................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**
**(රාජ්‍ය ආයතනවල/ පළාත් රාජ්‍ය සේවයේ/ ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)**

**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්,**

මෙම ආයතනයේ ............................................................................... තනතුර දරන, .............................................. මයා/ මිය/ මෙනවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු/ ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති/ නොමැති බවත්, ඔහුගේ / ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහි ව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/ නොහැක. (කරුණාකර අනවශ්‍ය වචන කපා හරින්න.)

දිනය : .................................... .............................................................,
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

03 - 407/1

## රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

### ඡායාරූප ශිල්පී (III) ශ්‍රේණිය (අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණය) තනතුරට විවෘත පදනමින් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින ඉහත සඳහන් තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්වයකින් හා විශිෂ්ය චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත්, අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ **2026 අප්‍රේල් මස 20 දින** හෝ ඊට පෙර ලැබෙන සේ, **"රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්,රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, කිරුළපන මාවත, කොළඹ 05"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. තමන් අයදුම්කරන තනතුර, කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය. (මෙම දැන්වීම www.governmentinformation.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබා ගත හැකි ය.)

**ඡායාරූප ශිල්පී (III) තනතුර - පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 06**

**1.** **වැටුප් පරිමාණය :-** 2025.03.25 දිනැති අංක 10/2025 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 03-2025 වැටුප් කේතය යටතේ වන

**රු.52,250-10×800-11×1,190-10×1,320-10×1,350-රු.100,040/-** ක්

මෙම තනතුරට හිමිවන අතර, එම වැටුප ඔබට හිමිවන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මක වන දින සිට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

**2.** **වයස් සීමාව :-** අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

**3.** **අධ්‍යාපන සුදුසුකම් :-**

**i.** සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

**ii.** භෞතික විද්‍යාව/රසායන විද්‍යාව ඇතුළත්ව විද්‍යා විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත් වීම.

**4.** **වෘත්තීය සුදුසුකම් :-** තෘතීයික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් වෘත්තීය පුහුණු ආයතනයක එක් අවුරුද්දකට නොඅඩු, නිශ්චල ඡායාරූපකරණයට අදාළ ඩිප්ලෝමා පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

**සංලක්ෂ්‍යය :-** මෙම වෘත්තීය සුදුසුකම් රැකියා ක්ෂේත්‍රයට අදාළ ව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ විය යුතු ය.

**5.** **පළපුරුද්ද :-** අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**6.** **කායික සුදුසුකම් :-**
සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

**7.** **වෙනත් සුදුසුකම් :-**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

II. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

III. තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය ඉහත දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු යි.

**8.** **බඳවා ගැනීමේ ක්‍රමය :-** ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

**9.** **විභාග පරිපාටිය :-** මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතු ය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| පොදු පරීක්ෂණය (තාක්ෂණික හා විෂයානුබද්ධ පරීක්ෂණය) | පැය 01 | 100 | 40 |

විභාගය සඳහාවන විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලත්වයත්, සිතීමේ විශ්ලේෂණ තත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්වය කිරීම සඳහා සැකසූ බහුවරණ ප්‍රශ්නවලින් යුතු ප්‍රශ්න පත්‍රයකි. |
| පොදු පරීක්ෂණය (තාක්ෂණික හා විෂයානුබද්ධ පරීක්ෂණය) | තනතුරුවලට අදාළව බහුවරණ ස්වරූපයෙන් යුක්ත ප්‍රශ්න හා තෝරාගෙන පිළිතුරු සැපයිය හැකි ව්‍යුහගත ස්වභාවයේ ප්‍රශ්නවලින් සමන්විතය. |

**10. සේවා නියමයන් හා කොන්දේසි :-**

**I.** මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. ඔබ වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

**II.** මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ. තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවාගැනීම් පටිපාටියේ සඳහන් ආකාරයට පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

**III.** 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සහ ඊට අනුෂාංගික සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කළ යුතු වේ.

**IV.** 2022.12.14 දිනැති හා අංක 2310/29 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පළ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති වලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තුවේ අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත් වේ.

**V.** ඉල්ලුම්කරනු ලබන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ නොදෙන අතර ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍ය වනුයේ ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

**11.** **තනතුරට අදාළ කාර්යයන් :-** දෙපාර්තමේන්තුවේ නිශ්චල ඡායාරූපකරණයට අදාළ කාර්යයන් ඉටු කිරීම.

**12.** අයදුම්කරුවන් විසින් සහතිකවල සහතික කළ පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට අමුණා එවිය යුතු අතර ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

I. උප්පැන්න සහතිකය,
II. අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන ලිපි,
III. වෘත්තීමය සුදුසුකම් සනාථ කෙරෙන ලිපි.

**13.** රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවිය යුතු ය.

**14.** අයදුම්පත්‍රයෙහි සඳහන්වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමටද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

**15.** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන ( දැනට රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන්නේ නම්) හෝ, ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**16.** **අත්සන සහතික කිරීම :-** දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවෙකුගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු විසිනි. අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන්, ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතුය. එනම් සමාදාන විනිශ්වයකාරවරයෙකු, නීතිඥයකු, නොතාරිස් කෙනෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයකු, වාර්ෂිකව රු.782,808/- ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු, බෞද්ධ විහාරයක විහාරාධිපතිනායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන කෙනෙකු විය යුතු ය.

**17.** **විභාග කොන්දේසි :-**

I. විභාග ගාස්තුව රු.1,000/- කි.විභාග ගාස්තු ගෙවීමේ දී **රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ නමින් මහජන බැංකුවේ නාරාහේන්පිට ශාඛාවේ 119100109026220 ගිණුම් අංකය** වෙත බැර කර, එහි රිසිට්පත අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ අලවා එවිය යුතු ය.

II. රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ආයතනයක් මගින් **ලිඛිත විභාගය 2026 මැයි මස කොළඹ දී පවත්වනු ලැබේ.**

III. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වෙත රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද ආයතනය මඟින් විභාග ප්‍රවේශ පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් යොමු කරනු ලැබේ.

IV. විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය.

**18.** සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවැනි අවස්ථාවක සිංහල නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**එච්. එස්. කේ. ජේ. බණ්ඩාර,**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

2026 මාර්තු මස 10 දින,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
163, කිලරුපන මාවත,
කොළඹ 05.

| මාධ්‍යය | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |
| ඉංග්‍රීසි | |

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

ඡායාරූප ශිල්පි (III) - විවෘත පදනම

**ආදර්ශ අයදුම්පත්‍රය**

01 (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) : ..............................................................................................................
..............................................................................................................

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහලෙන්) : ..............................................................................................................
..............................................................................................................

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : (Mr. / Mrs./ Miss)
..............................................................................................................
..............................................................................................................

2.0 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

3.0 (අ) පෞද්ගලික ලිපිනය : ..............................................................................................................
..............................................................................................................
..............................................................................................................

දුරකථන අංකය : | | | | | | | | | | |

(ආ) කාර්යාලයීය ලිපිනය (තිබේනම්) :
..............................................................................................................
..............................................................................................................
..............................................................................................................

දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කළ යුතු ලිපිනය :

**පෞද්ගලික** ☐ **කාර්යාලයීය** ☐

04. (අ) උපන් දිනය : අවුරුද්ද: .......................... මාසය : ........................ දිනය : .......................

(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතු ය.)

(ආ) අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස : අවු. .......................... මාස : ........................ දින : .......................

5.0 විවාහක/ අවිවාහක බව : විවාහක/ අවිවාහක

6.0 ස්ත්‍රී / පුරුෂභාවය : ස්ත්‍රී / පුරුෂ

7.0 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු ද යන බව : ඔව්/ නැත

8.0 අධ්‍යාපන සුදුසුකම් : (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.)

අ.පො.ස. (උ/පෙළ) විභාගය : වර්ෂය .......................... විභාග අංකය : ........................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

අ.පො.ස. (සා/පෙළ) විභාගය : වර්ෂය .......................... විභාග අංකය : ........................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

9. වෘත්තීය සුදුසුකම් : (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.)

| *පාඨමාලාව* | *ආයතනය* | *වලංගු දිනය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

10. වෙනත් සුදුසුකම් : (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.)

| *ආයතනය* | *සුදුසුකම්* | *අදාළ කාල සීමාව/ වලංගු කාලය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

11. වත්මන් රැකියාව පිළිබඳ විස්තර : (දැනට රැකියාවක නියුතුවන්නන් විසින් පමණක් සම්පූර්ණ කරන්න)

(අ) ආයතනයේ නම හා ලිපිනය : ..................................................................................................................
..................................................................................................................................................
(ආ) මුල් පත්වීමේ දිනය : .......................................................................................................................
(ඇ) දැනට දරන තනතුර : .........................................................................................................................

12. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද? ඔව්/ නැත
ඔව් නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න.
.........................................................................................................................................................
.........................................................................................................................................................

13. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද? ඔව්/ නැත
ඔව් නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න.
.........................................................................................................................................................
.........................................................................................................................................................

14. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

I. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය : ..........................................................................
II. ලදුපත් අංකය හා දිනය : ...........................................................................
III. ගෙවූ මුදල : ......................................................................

| |
|---|
| විභාග ගාස්තු ගෙවන ලද ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |

**15. අයදුම්කරුගේ සහතිකය :**

මවිසින් මෙම අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළිවුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත් කිසිඳු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමටත් හේතුවන බව දන්වමි.

.................................. ........................................................,
දිනය අයදුම්කරුගේ අත්සන.

**16. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................................................ මයා/ මිය/ මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී .............................. දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බව ද, සහතික කරමි.

දිනය ..................................

.......................................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

සම්පූර්ණ නම :........................................
තනතුර :........................................
දිනය :........................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**
**(රාජ්‍ය ආයතනවල/ පළාත් රාජ්‍ය සේවයේ/ ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)**

**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්,**

මෙම ආයතනයේ ........................................................................... තනතුර දරන, ............................................. මයා/ මිය/ මෙනවියගේ අයදුම්පත නිර්දේශකර ඉදිරිපත් කරමි. ඔහු/ ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති/ නොමැති බවත්, ඔහුගේ / ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහි ව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස්කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/ නොහැක. (කරුණාකර අනවශ්‍ය වචන කපා හරින්න.)

දිනය : .....................................

.............................................................,
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

03 - 407/2

---

**ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය**

**(2025 අංක 18 දරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත හරහා සංස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත)**

**රාජ්‍ය පරිපාලනය සහ ප්‍රතිපත්ති සම්පාදනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (ප්‍රධාන බඳවා ගැනීම) 2026/2027**

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ රාජ්‍ය පරිපාලනය සහ ප්‍රතිපත්ති සම්පාදනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්/ උසස්පෙළ අවසන් කළ සිසුන්/ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ රැකියා නියුතු පිරිස්/ නීති පිළිබඳව උනන්දුවක් දක්වන පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයට අයදුම් කළ හැක.

සුදුසුකම් : අ.පො.ස. (උසස් පෙළ) ඕනෑම විෂය ධාරාවකින් ලබාගත් S සාමාර්ථ 3 ක් සහිතව සමත් වීම.

*හෝ*

වෘත්තීය සහ අධ්‍යාපනික වශයෙන් සලකා බැලිය හැකි වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

සම්පූර්ණ අර්ස (Total Credit) : 30කි.

සාමාසික ගණන : සාමාසික 02කි.

ඩිප්ලෝමාවේ ස්වභාවය : මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදය (විවෘත සහ දුරස්ථ අධ්‍යයනය) HND සඳහා ලියාපදිංචි විය හැක.

ඉගැන්වීම් ක්‍රමවේදය : LMS පද්ධතිය හරහා ඉගැන්වීම්. පහසු දිනයක් තුළ දී නැරඹිය හැකි පටිගත කරන ලද දේශන සහ නිබන්ධන ලබාදීම සිදුකෙරේ.

මාධ්‍ය : සිංහල හෝ ඉංග්‍රීසි

පාඨමාලා කාලය : මාස 12කි

පාඨමාලා ගාස්තු සහ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු : සම්පූර්ණ ඩිප්ලෝමාව සඳහා අයකිරීම රු. 36,000කි. ඩිප්ලෝමාව සඳහා ලියාපදිංචි වීමේ දී රු. 1000ක මුදලක් ලියාපදිංචි ගාස්තුව වශයෙන් ගෙවිය යුතු ය. රු. 36,000 ක මුදල එකවර හෝ වාරික 10කින් ගෙවා අවසන් කළ හැකි වේ.

පාඨමාලාව සඳහා අයදුම් කළ යුතු ආකාරය :

අයදුම්කරු විසින්,

1. තම ජාතික හැඳුනුම්පතේ/ ගමන් බලපත්‍රයේ හෝ වෙනත් හඳුනාගත හැකි ඡායාරූපයක්,
2. අ.පො.ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනයේ හෝ වෙනත් අධ්‍යාපනික සහතික ඡායාරූප,
3. තම වර්ණවත් පැහැදිලි ඡායාරූපයක්

070 533 7702 (WhatsApp) අංකයට යොමු කළ යුතු ය.

වැඩි විස්තර සඳහා :- කාර්යාල වේලාවන්වන පෙ. ව. 8.30 සිට ප. ව. 4.30 දක්වා 081 316 9800 දුරකථන අංකය හරහා විමසිය හැකිය.

ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරි,
ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය.

03 - 551

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය

**සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

01. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී පවතින විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරුවලට බඳවාගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

i. මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදු කරනුයේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර සඳහා වේ.

ii. ලිඛිත විභාගය - මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ.

   i. ඉංග්‍රීසි භාෂාව
   ii. සාමාන්‍ය බුද්ධිය

02. විභාග දිනය සහ විභාගය පැවැත්වීම :

මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් **2026 ජූලි මස කොළඹ දී** පවත්වනු ඇත.

03. පත්කරනු ලබන මුළු පුරප්පාඩු සංඛ්‍යාව දෙකකි. (02) අවසාන පුරපාඩුව සඳහා හෝ පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබාගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවකදී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳව කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 92 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ. පත්වීම ක්‍රියාත්මකවන දිනය සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.

04. සේවා කොන්දේසි :

4.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 2310/29 සහ 2022.12.14 වැනි දින දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යපටිපාටික රීතිවලට ද, 2012.07.10 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ විධායක නිලධර ගණයට අයත් තනතුරු සඳහාවන බඳවා ගැනීම් පටිපාටියේ නියමයන්ට හා කොන්දේසිවලට ද, එම පටිපාටියට කර ඇති හෝ මින් මතුවට කෙරෙන්නා වූ සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු තනතුරෙහි III ශ්‍රේණිය සඳහා පත් කෙරෙනු ඇත.

4.2 මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

4.3 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් ය. සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරට බඳවාගෙන වසර තුනක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු ය.

4.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරී නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හා / හෝ පත් කරන ලද තනතුරක රාජකාරි භාර ගැනීමට ප්‍රතික්ෂේප කරන හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීමට සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට බලය ඇත.

05. මාසික වැටුප් පරිමාණය

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි SL 1 වැටුප් බණ්ඩය අදාළ වේ. එම වැටුප් බණ්ඩයට හිමි වැටුප් පරිමාණය පහත පරිදි වේ.

රු. 82,150 – 10 x 2,400 -8 x 2,940 – 17 x 3,900 – රු. 195,970/-

(2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි රු.82, 150 ට අනුරූපී ආරම්භක පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ.)

06. බඳවා ගැනීමේ සුදුසුකම් :

(අ) (i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
(iii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වීම.

(ආ) අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම්/පළපුරුද්ද :

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම;

*හා*

ii. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වීම;

*හා*

iii. දිව්රුම් දීමෙන් අනතුරුව නීතිඥයකු වශයෙන් අවුරුදු 03කට නොඅඩු සක්‍රීය පළපුරුද්දක් තිබීම.

(ඇ) වයස :

අවුරුදු 21 ට නොඅඩු හා වයස අවුරුදු 35 ට වැඩි නොවිය යුතු ය. ( ඒ අනුව 2005.04.20 දිනට හෝ ඊට පෙර හා 1991.04.20 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත)

(ඈ) සුදුසුකම් පිළිබඳ සීමාවන් :

i. යම් ආගමක පැවිදිවරයෙක් දරන කිසිදු තැනැත්තකුට අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට අවසර නොමැත.

ii. මෙම විභාගය සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ එදිනට පෙර වනවිට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

07. විභාග ගාස්තු:

විභාග ගාස්තුව රු.1,200.00කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින්(Any Bank Debit card with the Facility of Internet Transactions);
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මගින් (Online Banking Method of Bank of Ceylon);
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින්(Any Branch of the Bank of Ceylon).

*සටහන :-*

(අ) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

08. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

8.1 අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/ E.B. Exams" ඔස්සේ පළ කර ඇති අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම

**2026 මාර්තු මස 20 දින පෙ.ව. 09.00 ට විවෘත වන අතර 2026 අප්‍රේල් මස 20 දින ප.ව. 09.00 ට අවසන් වේ.**

8.2 දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

8.3 අයදුම්පත් යොමු කිරීමේ අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

8.4 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.5 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ මුද්‍රිත පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කරගත යුතුය. විභාග ශාලාවේ දී/ සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

8.6 විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී, රජයේ පාසලක ප්‍රධානියකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

09. විභාගයට ඇතුළු වීම :

(*අ*) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයකුම විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපතිවරයා වෙත භාර දිය යුතුය. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට ඉදිරිපත් වීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට්* පත්‍රය ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස්

ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට/ ඇයට සිදු වනු ඇත.

(ආ) අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

10. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

(i.) ජාතික හැඳුනුම්පත;
(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(iii.) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකිවන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව සනාථ කර ගත හැකිවන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන කිසිවකු විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

11. සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම් :

අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍යව තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු / ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ ඇය ගේ පත්වීම අහෝසි කිරීමට කටයුතු කෙරේ.

12. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :

(අ) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

(ආ) තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විභාග භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.

13. බඳවා ගැනීමේ ක්‍රමය :

1. ලිඛිත විභාගය -

මෙම දැන්වීමේ 01 ඡේදය (ii) කරුණේ සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර 02කින් ලිඛිත විභාගයක් පැවැත්වේ. එක් එක් විෂයයෙන් සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 40%ක් බැගින් ලබාගත යුතු ය. අපේක්ෂකයන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු වේ.

විෂයයන් : 1. ඉංග්‍රීසි
2. සාමාන්‍ය බුද්ධිය

• ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය:

| *විෂය අංකය* | *විෂයය* | *නියමිත කාලය* | *ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය (අවම)* |
|---|---|---|---|---|
| 01. | ඉංග්‍රීසි භාෂාව | පැය 02 | 100 | 40% |
| 02. | සාමාන්‍ය බුද්ධිය | පැය 01 | 100 | 40% |

(අ) ඉංග්‍රීසි භාෂාව:

(i.) අවබෝධය :

වචන 200ට නොවැඩි තෝරාගත් ලිඛිත ඛණ්ඩයක් කියවා අවබෝධ කර පිළිතුරු සැපයීමේ හැකියාව පරීක්ෂා කෙරේ.

(ii.) ව්‍යාකරණ :

කාල, නාම, ක්‍රියා, ඍජු සහ වක්‍ර කථනය, කර්මකාරක හා කතෘකාරක වාක්‍ය, ලිංග භේදය, නිපාත ආදී ක්ෂේත්‍රයන්හි සරල අවබෝධය පරීක්ෂා කෙරේ. ව්‍යාකරණ, වාග් මාලාව සහ අවබෝධය පිළිබඳව අපේක්ෂකයා සතු දැනුම පිරික්සීම ද සිදුකරයි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(ආ) සාමාන්‍ය බුද්ධිය :

පදගත, සංඛ්‍යාත්මක සහ රූපාකාර සන්දර්භයන් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමන සහ ප්‍රතිචාර පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය සහ බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්න

පත්‍රය ප්‍රශ්න 50 කින් යුක්ත වන අතර එම ප්‍රශ්න බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

2. සම්මුඛ පරීක්ෂණය -

(අ) ලිඛිත පරීක්ෂණයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිට, සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම ලකුණු 40% ට නොඅඩුව ලබා ගත් අයදුම්කරුවන් අතරින් ප්‍රමුඛතාව අනුව ඉහළම ලකුණු ලබා ගත්, පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් පිරිසක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබයි.

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අපේක්ෂක අපේක්ෂිකාවන්ගේ මූලික සුදුසුකම් හා සහතික පත්‍ර පරීක්ෂා කරනු ලබයි. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා නොදේ.

*සැලකිය යුතුයි* :- සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

❖ කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

14. පත්වීම් බලධරයා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු / මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියළුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත.

15. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට්* පත්‍රයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

16. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් පවතී නම්, සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කළ යුතු ය.

කේ.ඒ.පී. ද සිල්වා,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*වැ.බ.*).

2026 මාර්තු මස 11 දින,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
අංක 400, "සමාගම් මැඳුර",
ඩී.ආර්.විජේවර්ධන මාවත,
කොළඹ 10.

03-576

**මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**
**රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව**

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර/කාර්යාලගත නිලධාරි ඛණ්ඩ -2 හි II පන්තියේ II ශ්‍රේණියේ සහකාර තක්සේරුකරු තනතුරට බඳවා ගැනීම සඳහා විවෘත තරග විභාගය 2025 (2026)

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ II පන්තියේ II ශ්‍රේණියේ සහකාර තක්සේරුකරු තනතුරට 99 දෙනකු බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් **2026 ජූලි මාසයේ දී කොළඹ දී** පමණක් පවත්වනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනය යථා කාලයේ දී දැනුම් දෙනු ඇත.

* අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/ E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම

  **2026 මාර්තු 23 දින පෙ.ව. 09.00 ට විවෘත වන අතර 2026 අප්‍රේල් 23 දින ප.ව. 09.00 ට අවසන් වේ.**

* දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

* අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

මෙකී විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය ප්‍රධාන තක්සේරුකරු සතුවේ.

මෙහි පහත සඳහන් සුදුසුකම් සතුව ඇති ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම මෙම තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **සුදුසුකම්:-**

I **අධ්‍යාපන සුදුසුකම් :-**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන දේපළ කළමනාකරණය සහ තක්සේරුකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ එක්සත් රාජධානියේ වරලත් මිනින්දෝරුවරුන්ගේ රාජකීය ආයතනයේ සාමාජිකත්වය සහිත වරලත් තක්සේරුකරුවකු වීම.

II **කායික සුදුසුකම්:-**

සෑම අපේක්ෂකයකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

III **වෙනත් සුදුසුකම්:-**

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
(ආ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
(ඇ) සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් **2026 පෙබරවාරි මස 28** දිනට සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

02. **වයස:-**

I **අවම සීමාව :-** අවු. 21 ට නොඅඩු
II **උපරිම සීමාව :-** අවු.35ට නොවැඩි

(ඒ අනුව 2005.02.28 දිනට හෝ ඊට පෙර හා 1991.02.28 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

*සටහන:-*

I යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට ඉඩ ලබා නොදෙනු ඇත.

II උපාධියට අදාළ විභාගයක ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින කිසිදු අපේක්ෂකයකුට මෙම විභාගයට පෙනී සිටීමට නොහැක. කෙසේ වුව ද ඉහත සුදුසුකම්වලට අදාළ උපාධිය සමත් වූ අයකුට ඔහු/ඇය එම උපාධිය 2026.02.28 දිනට සම්පූර්ණ කර ඇති බවට එම විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිගෙන් ලබාගත් නිල ලිපියක් ඉදිරිපත් කළ අවස්ථාවක දී මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ ලබාදෙනු ඇත.

03. **සේවා කොන්දේසි**

I වැටුප- මෙම තනතුරට අයත් ඒකාබද්ධ වැටුප් පරිමාණය පහත දැක්වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි අනුව වැටුප් පරිමාණය MN 5 දරන වැටුප් ඛණ්ඩයේ

රු. 58,660-10 x 1,190-11 x 1,360-15 x 1,670- රු. 110,570/- ක් වේ.

II මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්විය යුතු ය.

III තෝරාගත් අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් පත්වීමේ දින සිට තුන් අවුරුදු තුනක (03) පරිවාස කාලයට යටත්ව පත් කරනු ලැබේ.

IV පත්වීම් ලබන්නන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ද නැතිද යන වගට ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.

V පත්වීම් ලබන්නන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිනු ඇත.

VI රාජ්‍ය සේවා කොමිෂන් සභා අංක: 2310/29 හි සඳහන් කාර්ය පටිපාටික රීතිවල සඳහන් කොන්දේසිවලට හා මෙම *ගැසට් පත්‍රයේ* 1 කොටසේ (IIඅ) ඡේදයේ ආරම්භයේ පළකොට ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත්කිරීම්වලට අදාළ පොදු කොන්දේසිවලට ද අවධානය යොමු කෙරේ.

VII මෙම තනතුර අංක: 2142/75 හා 2019.09.27 දිනැති *ගැසට්* නිවේදනයේ පළකර ඇති ශ්‍රී ලංකා තක්සේරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පවතින විධිවිධානවලට අනුව පාලනය වනු ඇත.

04. **බඳවා ගැනීමේ ක්‍රමය:-**

ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලබන අතරම සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා නොදේ. එහිදී, අදාළ සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කරනු ලැබේ.

05. **විභාග පරිපාටිය:-**

බඳවා ගැනීම සඳහා වන තරග විභාගය ලිඛිත ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ. ඒ පිළිබඳ විස්තර පහතින් දැක්වේ.

| *විෂයය අංක* | *ප්‍රශ්න පත්‍රයේ නම* | *කාලය පැය/ විනාඩි* | *සමත්වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය I කොටස | විනාඩි 30 | 40 | 100 |
| 02 | විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය II කොටස | පැය 1½ | 40 | 100 |

(අ) විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය I කොටස

දේපළ පාලනය සහ තක්සේරු ශාස්ත්‍රය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සඳහා හදාරනු ලබන විෂයයන්ට අදාළ ප්‍රශ්න 25කට නොවැඩි බහුවරණ ප්‍රශ්න ඇතුළත් වේ.

(ආ) විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය II කොටස

දේපළ පාලනය සහ තක්සේරු ශාස්ත්‍රය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සඳහා හදාරනු ලබන විෂයය ක්ෂේත්‍රයට අදාළ මාතෘකාවන් ඇතුළත්ව සකස් කෙරුණු රචනා සහ ව්‍යුහගත ශෛලියේ ප්‍රශ්න ඇතුළත් වේ.

*සටහන:-*

මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. විභාගය සඳහා අයදුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(I) ඇගයීමේදී අත් අකුරු හා අක්ෂර වින්‍යාසය ද සැලකිල්ලට ගනු ලැබේ.

(II) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම්කර ඇති අපේක්ෂකයන්ට/ අපේක්ෂිකාවන්ට විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. එහෙත් විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍ර ලැබීම විභාගය සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීමක් ලෙස නොසැලිකිය යුතු ය.

(III) ඇගයීමේ ක්‍රමය: තරග විභාගයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ලකුණුවල එකතුවට අනුව ප්‍රමුඛතා ලේඛනයක් සකස් කරනු ලැබේ. ඔවුන් අතරින් ඉහළම ලකුණු ලබාගත් අපේක්ෂකයාගේ සිට පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට අනුපාතිකව අපේක්ෂකයන් සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

06. **තෝරා ගැනීමේ පදනම:**

ලිඛිත විභාගයෙන් සමත් වූ හා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලත් අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් අදාළ බඳවා ගැනීම සඳහා පුරප්පාඩු සංඛ්‍යාවට යටත්ව පත්වීම් පිරිනැමීම සඳහා තෝරා ගනු ලැබේ.

(I) **ප්‍රතිඵල නිකුත් කිරීම**

පත්වීම් බලධරයා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු / මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වේ.

07. සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලුම සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

08. **ඉල්ලුම් කිරීමේ පිළිවෙළ:-**

**ආදර්ශ අයදුම්පත:**

(1) මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**09. විභාග ගාස්තු:**

විභාග ගාස්තුව රු. 600/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/ Flex යෙදවුම මගින් (Online Banking Method/ Flex App of Bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

*සටහන:-*

(*අ*). ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*). ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවිඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*). විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

10. **විභාග ප්‍රවේශ පත්‍ර:**

(1) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

11. **විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍ර සහතික කර ගැනීම:**

(II) විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී, රජයේ පාසලක ප්‍රධානියකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

**විභාගයට ඇතුළත්කර ගැනීම:-**

(III) විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයකුම නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. විභාගයට පෙනී සිටින පළමු දිනයේම, විභාග ශාලාධිපතිවරයා වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

(IV) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහු හෝ ඇයට සිදුවනු ඇත.

*සටහන:-*

විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අපේක්ෂකයකු විභාගයට පෙනී සිටීමට හෝ තනතුර සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකේ.

12. අනන්‍යතාව :-

* විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත,

II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,

III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන් ම, විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකිවන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

13. සාවද්‍ය තොරතුරු සැපයීම:- මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකුට ඊට පෙනී සිටීමට සුදුසුකම් නැති බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ කවර අවස්ථාවක දී වුව ද, ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අපේක්ෂකයකු විසින් දැන දැනම සාවද්‍ය තොරතුරක් සපයා ඇති බවක් හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත් හෝ ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට නුසුදුස්සකුව සිටි බව ඔහුගේ/ඇයගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවක දී ඔප්පු වුවහොත්, හෝ ඔහු/ඇය වහාම සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත. මෙම නිවේදනයේ සඳහන් අවශ්‍යතා නියමිත අයුරින් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

14. මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද අදාළ වූ වෙනයම් කරුණක් වේ නම් එය ප්‍රධාන තක්සේරුකරුගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

15. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පැන නැඟුනහොත් එවැනි විටෙක දී සිංහල මාධ්‍ය නිවේදනය බල පැවැත්වේ.

**ඒ.එස්.ඩබ්.කේ. නානායක්කාර,**
රජයේ ප්‍රධාන තක්සේරුකරු.

03 - 532

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

01. අංක 2088/26 දරන 2018.09.11 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවා ව්‍යවස්ථාවෙහි දක්වා ඇති විධිවිධානයන්ට අනුව උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026 සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම විභාගය අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට අනුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාට බලය ඇත.

02. සේවා කොන්දේසි

2.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානයන්ට යටත්ව බඳවාගනු ලබන අධිකරණ ලසු ලේඛක සේවයේ නිලධරයන් ආයතන සංග්‍රහයට, මුදල් රෙගුලාසිවලට, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් දැනටමත් නිකුත්කර ඇති සහ කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛ, නියෝග සහ විධානයන්ට යටත් වන්නේ ය.

2.2 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් ය. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක (සිංහල/දෙමළ/ ඉංග්‍රීසි) III ශ්‍රේණියට බඳවාගෙන වසර 05 ක් ගතවීමට පෙර සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතු ය.

2.3 තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත්වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාට බලය ඇත.

2.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සහ ඊට අනුකූලව නිකුත් කරන ලද අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 456 පරිදි උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියට අදාළ ද්විතීක මට්ටම අනුව තනතුරට බැඳී වසර 03 ක් ඇතුලත අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

03. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හා 2025.03.25 දිනැති චක්‍රලේඛය අනුව, උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණිය සේවයට අදාළ වැටුප් ක්‍රමය පහත සඳහන් පරිදි වේ.

වැටුප් කේතය - (MN 2-2025)

වැටුප් පරිමාණය (මාසිකව) - රු.48,470/– 10 x 540 - 11 x 630 - 10 x 1010 - 10 x 1190 - රු.82,800/-

අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියට බඳවාගනු ලබන අයදුම්කරුවන් රු.48,470/-ක ආරම්භක වැටුප් තලයේ පිහිටවනු ලබන අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හා 2025.03.25 දිනැති චක්‍රලේඛයේ උපලේඛන III පරිදි වැටුප් ගෙවනු ලැබේ.

04. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

විශ්‍රාම වැටුප් සහිත බව ඉහතින් දක්වා තිබුණද අනාගතයේ බඳවාගනු ලබන අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියට පත්වන නිලධාරින් සම්බන්ධයෙන් ඔවුන්ට අදාළ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය හා/හෝ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ඉදිරියේ දී ගනු ලබන තීරණයකට ඔවුන් යටත් වන්නේ ය.

05. සුදුසුකම්:

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා පහත සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

(*ආ*) **2026.03.20** දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

(*ඇ*) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(*ඈ*) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණකර තිබිය යුතු ය.

(I) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව ඇතුලුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී ගණිතය ඇතුලු විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම. (අධිකරණ ලඝු ලේඛක (සිංහල) තනතුරට අයදුම්කරන අයදුම්කරුවන්ට සිංහල භාෂාව සඳහා ද, අධිකරණ ලඝු ලේඛක (දෙමළ) තනතුරට අයදුම්කරන අයදුම්කරුවන්ට දෙමළ භාෂාව සඳහා ද, අධිකරණ ලඝු ලේඛක (ඉංග්‍රීසි) තනතුරට අයදුම්කරන අයදුම්කරුවන්ට ඉංග්‍රීසි භාෂාව සඳහා ද සම්මාන සාමාර්ථයක් තිබිය යුතු ය.);

*සහ*

(II) ජාතික තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, කාර්මික විද්‍යාල හෝ රජයේ ලියාපදිංචි පුහුණු ආයතනයක ලඝු ලේඛනය සහ යතුරු ලියනය පාඨමාලාවක් සාර්ථකව හදාරා ඉන් සමත්ව තිබීම.

(*ඉ*) උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයට බඳවා ගනු ලබන සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

*සැ.යු* - සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් **2026 මාර්තු මස 20** දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

06. විභාග පටිපාටිය :-

විභාගය ප්‍රශ්න පත්‍ර තුනකින් (03)යුක්ත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *මුළු ලකුණු* | *සමත්වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු* |
|---|---|---|
| 01. භාෂා හැකියාව (සිංහල/දෙමළ) | 100 | 40 |
| 02. අභියෝග්‍යතාවය (සිංහල/දෙමළ) | 100 | 40 |
| 03. ලඝු ලේඛනය හා යතුරු ලියනය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | 100 | * |

(* පුරප්පාඩු සංඛ්‍යාව සැලකිල්ලට ගෙන ලඝු ලේඛනය හා යතුරු ලියන විෂයයේ සමත්වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු අධිකරණ සේවා කොමිෂන් සභාවේ අභිමතය අනුව තීරණය කරනු ඇත.)

මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ. අපේක්ෂකයෙකුට තමන් කැමති එක් මාධ්‍යයකින් පමණක් විභාගයට පෙනී සිටිය හැක.

අයදුම්කරු විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යයෙන් පමණක් "භාෂා හැකියාව" හා "අභියෝග්‍යතාව" යන ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයිය යුතු ය.

'ලඝු ලේඛනය හා යතුරු ලියනය' සඳහා තමන් අයදුම් කරන **ගණය** තෝරා ගත යුතු ය.

**විභාගය සඳහාවන විෂයය නිර්දේශය;**

| | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|---|
| 01 | භාෂා හැකියාව (සිංහල/දෙමළ) | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, ලිපි කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්ථාර සහ වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. |
| 02 | අභියෝග්‍යතාවය (සිංහල/දෙමළ) | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. |
| 03 | ලඝු ලේඛනය හා යතුරු ලියනය (සිංහල/දෙමළ/ ඉංග්‍රීසි) | ලඝු ලේඛනය (සිංහල)<br>විනාඩියකට වචන 70 ක අවම වේගයෙන් විනාඩි 05 ක් තුළ කියවනු ලබන පාඨයක් ලඝු ලේඛනය කර එය විනාඩියකට වචන 07 ක වේගයෙන් යතුරු ලියනය කිරීම<br><br>යතුරු ලියනය (සිංහල)<br>දෙනු ලබන වචන 500 ක ඡේදයක් විනාඩියකට වචන 25 ක වේගයෙන් යතුරු ලියනය කිරීම |
| | | ලඝු ලේඛනය (දෙමළ)<br>විනාඩියකට වචන 70 ක අවම වේගයෙන් විනාඩි 05 ක් තුළ කියවනු ලබන පාඨයක් ලඝු ලේඛනයකර එය විනාඩියකට වචන 07 ක වේගයෙන් යතුරු ලියනය කිරීම<br><br>යතුරු ලියනය (දෙමළ)<br>දෙනු ලබන වචන 500 ක ඡේදයක් විනාඩියකට වචන 25 ක වේගයෙන් යතුරු ලියනය කිරීම |
| | | ලඝු ලේඛනය (ඉංග්‍රීසි)<br>විනාඩියකට වචන 80 ක අවම වේගයෙන් විනාඩි 05 ක් තුළ කියවනු ලබන පාඨයක් ලඝු ලේඛනයකර එය විනාඩියකට වචන 08 ක වේගයෙන් පිටපත් කිරීම.<br><br>යතුරු ලියනය (ඉංග්‍රීසි)<br>දෙනු ලබන වචන 600 ක ඡේදයක් විනාඩියකට වචන 30 ක වේගයෙන් යතුරු ලියනය කිරීම. |

**සටහන** : සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන්ම අපැහැදිලි අත් අකුරු සම්බන්ධයෙන් ලකුණු අඩුකරනු ලැබේ.

මෙම ප්‍රශ්නපත්‍ර බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න, රචනා ප්‍රශ්න හා /හෝ ප්‍රායෝගික ප්‍රශ්නවලින් සමන්විත වනු ඇත.

07. විභාගයේ සියලු විෂයයන් සමත් අපේක්ෂකයින් අතරින් ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයාගේ සිට පහළට ලකුණු අනුපිළිවෙල අනුගමනය කරමින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසු එකී විභාගය සඳහා වෙන්කළ පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකිය. එසේ වුවද කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් නොපිරවීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් තීරණය කළ හැකිය.

විභාග ප්‍රතිඵල - අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම්දීම අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා මගින් තැපෑලෙන් සිදු කරනු ඇත.

08. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් -

වැදගත් යැයි සලකනු ලබන යම් කරුණක් ගැන සාවද්‍ය ප්‍රකාශයක් හෝ සත්‍ය වසන් කිරීමක් අයදුම්කරුවකු සිදුකල බවට හෙළිදරව් වූ අවස්ථාවක ප්‍රකාශය හෝ වසන් කිරීම හෙළිදරව් වූයේ තෝරා ගැනීමට ප්‍රථමයෙන් නම් අයදුම්කරු නුසුදුස්සකු බවට පත් කිරීමටත්, තෝරා ගැනීමෙන් පසු නම් සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමටත් යටත් වනු ඇත.

09. විභාග ගාස්තු -

විභාග ගාස්තුව රු. 400 කි. මෙම මුදල **"අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්" නමින් මහජන බැංකුව, වෙල්ල වීදිය ශාඛාවේ පවත්වාගෙන යන ගිණුම් අංක 297100199025039** ට බැර කර ලබා ගන්නා ලද ලදුපත එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළවෙන සේ ඇලවිය යුතු ය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

10. ඉල්ලුම් කිරීමේ ක්‍රමය -

(අ) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8 ½" x 12" (A 4) ප්‍රමාණයේ කඩදාසියක සකස්කර අපේක්ෂකයා විසින් ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/ යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකිය.

ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන්කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.) සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුණහොත් අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැක.

(ආ) විභාගය සඳහාවන සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් **2026 අප්‍රේල් මස 24** දින හෝ ඊට පෙර ලැබෙන පිණිස "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12." යන ලිපිනයට එවිය යුතු ය. ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක (සිංහල/දෙමළ/ ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026"** යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතු ය. **2026 අප්‍රේල් මස 24** දිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාර ගනු නොලැබේ.

(ඇ) ඉල්ලුම් පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතිකකර තිබිය යුතු ය.

(ඈ) දැනට රාජ්‍ය සේවයේ නියුතු ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතු ය.

(ඉ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී ඉල්ලුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

11. විභාගයට පෙනී සිටීම -

ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර තැපැල් මගින් නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ඒ බව අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත දන්වා සිටිය යුතු ය. එසේ දැන්වීමේදී අයදුම්කල විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු ය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් මෙම විස්තර සමග ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද, සඳහන් කොට ඉල්ලීම් ලිපියක්, 0112 421 206 හෝ 0112 446 111 දරන ෆැක්ස් අංකයට අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත යොමු කරමින් විමසිය යුතු ය. තවද අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබා ගත් ඉල්ලුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවලට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපතිවරයා සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත;
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය.

13. විභාගයට ඇතුළත් වීම :

(අ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ ඉල්ලුම්පත්‍ර එවා ඇති අයදුම්කරුවන්ට අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයෙකුම ප්‍රවේශ පත්‍රයේ තබන අත්සන සහතික කරවා ගෙන පළමුවෙන්ම විභාගයට පෙනී සිටින දින, විභාග ශාලාධිපතිවරයා වෙත භාර දිය යුතු ය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

*සටහන -* අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

14. මෙම රෙගුලාසිවල සළකා නොමැති කරුණු පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

15. මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

ප්‍රසන්න අල්විස්,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2026 මාර්තු මස 11 දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026***

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

01. මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ.
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය සඳහන් කරන්න.
සිංහල - 1
දෙමළ - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක III ශ්‍රේණිය පහත දැක්වෙන **ගණ** වලින් සමන්විතය.
ලසු ලේඛක (සිංහල)
ලසු ලේඛක (දෙමළ)
ලසු ලේඛක (ඉංග්‍රීසි)

ඉල්ලුම් කරන තනතුරෙහි **ගණය** සඳහන් කරන්න.
සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3
(අදාළ අංකය කොටුව තුළ)

02. පෞද්ගලික තොරතුරු :

2.1 මුලකුරු සමග නම: Mr./Mrs./Miss. ..........................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) උදා : A.P.K. SIRIWARDANA

2.2 සම්පූර්ණ නම: ..........................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් )

2.3 සම්පූර්ණ නම : ..........................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

2.4 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන් ) :
..........................................................................................................

2.5 පදිංචි දිස්ත්‍රික්කය : ..........................................................................................................

2.6 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :
..........................................................................................................

2.7 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

2.8 උපන් දිනය :

වර්ෂය: [ ][ ][ ][ ] මාසය: [ ][ ] දිනය: [ ][ ]

2.9 **2026.03.20** දිනට වයස :

අවුරුදු : [ ][ ] මාස : [ ][ ] දින: [ ][ ]

2.10 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 1 ස්ත්‍රී – 2 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.11 විවාහක/අවිවාහක බව : විවාහක - 1 අවිවාහක – 2 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.12 දුරකථන අංකය :

ස්ථාවර : ................................ ජංගම:.....................................

විද්‍යුත් තැපැල:.......................... WhatsApp No. ....................................

03. අධ්‍යාපන සුදුසුකම්:

3.1 අ.පො.ස.(සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර:
(අ.පො.ස.(සා.පෙළ) විභාගයේ සහතික කළ සත්‍ය ඡායා පිටපතක් අමුණන්න)

(1) විභාගයේ වර්ෂය හා මාසය : .........

(2) විභාග අංකය: ..............................

(3) ප්‍රතිඵල:

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

3.2 අ.පො.ස (උසස් පෙළ) විභාගය පිළිබඳ විස්තර:

(1) විභාගයේ වර්ෂය හා මාසය :...........

(2) විභාග අංකය:................................

(3) ප්‍රතිඵල:

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |

04. ලසු ලේඛනය පිළිබඳ හදාරා ඇති පාඨමාලාව : ……………………………………………………
(පාඨමාලාව සමත් සහතිකයේ සහතික කළ සත්‍ය ඡායා පිටපතක් අමුණන්න)

05. වෙනත් සුදුසුකම්: ..........................................................................................................................................
..........................................................................................................................................

06. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ (√ ) ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

'ඔව්' නම් විස්තර සඳහන් කරන්න ..........................................................................................................................................

07. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර:

විභාග ගාස්තු ගෙවූ බැංකු ශාඛාව: .......................

ලදුපත් අංකය හා දිනය : ................................

ගෙවූ මුදල: ...................................................

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න<br><br>(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය) |
|---|

08. අයදුම්කරුගේ සහතිකය:

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් ඇති වන ප්‍රතිඵලය විඳ දරාගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් පනවනු ලබන නිති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

................ ..........................,
දිනය අයදුම්කරුගේ අත්සන.

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත, ඉදිරිපත් කරනු ලබන ................................................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන .................................. දින තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

....................... ..........................,
දිනය අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :........................................................................
තනතුර :........................................................................
ලිපිනය :........................................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

<u>**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**</u> (දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම .............................. සේවය කරන .................................................... මයා/මිය/මෙනවියට උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලසු ලේඛක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) III ශ්‍රේණිය තනතුරට ඉල්ලුම් කිරීමට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ද ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදාහරින බව ද ඔහුට/ඇයට **2026.03.20** දිනට වයස අවුරුදු 35 ට නොවැඩි බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී ...................................... දින අත්සන් කළ බව ද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සඳහන් කරමින් ඔහුගේ/ඇයගේ ඉල්ලුම් පත්‍රය නිර්දේශ කර මේ සමග ඉදිරිපත් කරමි.

දිනය :-

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන :-

නිල මුද්‍රාව :-

03-624

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.